# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
# EDB SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සනාථ වූ හැකියාවන් හා වෘත්තීය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (1) අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM 2-2)

**සුදුසුකම් :**

**(අ) බාහිර අයදුම්කරුවන් සඳහා (පහත i හෝ ii)**

(i) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වානිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම (Masters)

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර 20 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

හෝ

(ii) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වානිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම

සහ

ඉහත ඕනෑම ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය උපාධි සුදුසුකම (Ph.D)

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද තිබිය යුතුය.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක (HM 2-1) අවම වශයෙන් වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සහ

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්දක් සහිත විය යුතුය.

**(ඇ) රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පංතිය හා ඊට ඉහළ නිලධාරීන් ද්විතියන පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකි හෙයින් ඉල්ලුම් කළ හැක.

**වැටුප් පරිමාණය (HM 2-2) :**

රු. 93,020/- 12X 2,700 = රු. 125,420/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

## (2) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන තනතුර (HM 2-1) :

**රැකියා විස්තරය :**

ආයතනයේ සභාපති හා ප්‍රධාන විධායක විසින් පවරන සංවර්ධන, මෙහෙයුම් සහ තාක්ෂණික කටයුතුවලට අදාළ රාජකාරි / කාර්යයන් / බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම සහ අලෙවි සංවර්ධන වැඩ සටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.

**සුදුසුකම් :**

**(අ) බාහිර අයදුම්කරුවන් සඳහා (පහත i හෝ ii හෝ iii)**

(i) විද්‍යාව/කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය/ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාළ විෂය පථයෙහි ආශ්‍රිත සාමාජිකත්වය සමග

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එයින් වසර පහක් (5) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

(ii) තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

(iii) විද්‍යාව/කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය/ආර්ථික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක (HM 1-1) අවම වශයෙන් වසර 05 සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

සහ

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්දක් සහිත විය යුතුය.

**වැටුප් පරිමාණය (HM 2-1):**

රු. 91,645/- 12X 2,700 = රු. 124,045/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**ඉහත තනතුර (1) හා (2) සඳහා වයස :**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55ට නො වැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**ඉහත (1) හා (2) සඳහා තෝරා ගැනීමේ පිළිවෙල :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් සුදුසුකම්**

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**ඉහත තනතුර (1) හා (2) සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :**

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවානියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 08 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ලබාගත් ("Announcements" කාණ්ඩය යටතේ) EDB ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් 2024.01.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණානොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර සභාපති / ප්‍රධාන විධායක නිලධාරීවෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2020 දරන 2020.10.26 දිනැති චක්‍රලේඛයට අනුව අනුමත තනතුරු වල පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ වගකීම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම් සතුය.


**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB ටවර්, අංක 42, නවම් මාවත, කොළඹ 02**
**දුර : 011-2300700**